විශ්ව විද්‍යාල ආචාර්ය සමිති සම්මේලනය ඇතුළු විශ්ව විද්‍යාල අධ්‍යයන හා අනධ්‍යයන වෘත්තිය සංගම්, සැප්තැම්බර් 25, 2023 දින පෙරවරුවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම ඉදිරිපිට විරෝධතාවයක නිරත වූ බව මාධ්‍ය වාර්තා කරන ලදී. රජයේ අසාධාරණ බදු ප්‍රතිපත්තිය, විශ්වවිද්‍යාල පෞද්ගලීකරණය කිරීම, රාජ්‍ය පරිපාලනයේ ඇති අක්‍රමිකතා වැනි කරුණු රැසකට එරෙහි වෙමින් මෙම විරෝධතාවය පැවැත්වුණු බව වැඩිදුරටත් මාධ්‍ය වාර්තා කර තිබිණි.

මේ සම්බන්ධයෙන් වාර්තා කර තිබූ, සැප්තැම්බර් 25 රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් තුළ මෙම විරෝධතාවය ආවරණය වී තිබුණේ මෙලෙසිනි.

මෙම විරෝධතාවයට ලැබී තිබූ මාධ්‍ය ආවරණයන්ගේ වෙනස සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

